# පොළොන්නරුව තිවංක පිළිමගෙයි අන්තරාල සිතුවම් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. කේ. දිල්ෂාන්[1], කේ. ලංකාමුල්ල[2]

## හැඳින්වීම

පොලොන්නරුව තිවංක පිළිමගෙය ක්‍රි. ව. 1153-1186 අතර කාලයේ දී රජ කළ මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදි කරන ලද්දකි. මෙය පිහිටා තිබෙන්නේ පොලොන්නරුව ජේතවනාරාම විහාර සංකීර්ණයේ ය. මෙම විහාර ගෘහය පල්ලව ගෘහ නිර්මාණ ශිල්පයට නෑකම් කියන ගෙඩිගේ සම්ප්‍රදායට අයත් පිළිමගෙයකි (සමරසිංහ, 2019). තිවංක පිළිමගෙයි අන්තරාලයේ දක්නට ලැබෙන සිතුවම් අතරින් එක් සුවිශේෂ සිතුවමක් වන්නේ ස්ත්‍රියක හා පුරුෂයකු සම්භෝගයේ යෙදෙන සිතුවම යි. එම සිතුවම ඇඳ තිබෙන්නේ ආසංඛවතී ජාතකයෙහි සිදුවීම් නිරූපණය කරන්නා වූ සිතුවම් කොටස් අතරෙහි ය. එහෙත් වර්තමානය වන විට එය තිවංක පිළිමගෙයි දක්නට නො ලැබේ. එයට හේතුව වී ඇත්තේ මිනිසුන් එය අසභ්‍ය චිත්‍රයකැ'යි සිතා නියෙන් සූරා තිබීම යි. කෙසේ වුව ද පූර්වෝක්ත සිතුවමෙහි විශාල අනුරුවක් වර්තමානයේ කොළඹ ජාතික කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තබා තිබේ.

මෙම පර්යේෂණයෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ''තිවංක පිළිමගෙයි අන්තරාලයේ සිතුවම් කොට ඇති සම්භෝග චිත්‍රයෙහි පදනම කුමක් ද?'' යන්න යි. එම ගැටලුව අනුව යමින් මෙහි ප්‍රධාන අරමුණ වූයේ පොලොන්නරුව තිවංක පිළිමගෙයි අන්තරාලයේ ඇඳ ඇති සම්භෝග සිතුවමෙහි පදනම අනාවරණය කර ගැනීම යි. තිවංක පිළිමගෙයි කලා කෘති පිළිබඳ ව විවිධ සාහිත්‍ය කෘති ලියැවී තිබුණ ද එහි අන්තරාලයේ ඇඳ තිබෙන පූර්වෝක්ත සිතුවම පිළිබඳ ව සෘජු අධ්‍යයනයක් හෝ පර්යේෂණයක් සිදු කෙරී නොමැත. එය මෙම පර්යේෂණයේ පර්යේෂණ අන්තරය වශයෙන් පෙන්වා දිය හැකි ය. එම අන්තරය සම්පූර්ණ කිරීමට හැකි වීම මෙම පර්යේෂණයේ ඇති වැදගත්කම වේ. එමෙන් ම තිවංක පිළිමගෙයි කලා කෘති පිළිබඳ ඉදිරියට සිදු කෙරෙන පර්යේෂණ සඳහා මෙම පර්යේෂණයෙන් දත්ත ලබා ගැනීමට හැකි වීම ද මෙහි තවත් වැදගත්කමකි. පොලොන්නරු යුගය නම් කාල පරිච්ඡේදයට සීමා වීමත් තිවංක පිළිමගෙයි බිතු සිතුවම්වලින් එහි අන්තරාලයේ ඇඳ තිබෙන සම්භෝග සිතුවමට පමණක් සීමා වී තිබීමත් මෙහි පර්යේෂණ සීමා වේ.

## සාහිත්‍ය විමර්ශනය

පොලොන්නරු යුගයේ සිතුවම් සම්ප්‍රදාය අනුරාධපුර යුගයේ සිතුවම් සම්ප්‍රදායෙහි ම දිගුවකි. එමෙන් ම ඉන්දියාවේ අජන්තා හා ලක්දිව සීගිරි චිත්‍රයන්හි

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව. wkdilshan10@gmail.com

2. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව.

ලක්ෂණ පොලොන්නරු යුගයේ සිතුවම්හි දැකගත හැකි ය. මෙහි අන්තරාලයේ ඇඳ තිබෙන සිතුවම් ලෙස දේවාරාධනය, දිව්‍ය විමානයක කොටසක්, චුල්ල පදුම ජාතකය, මෛත්‍රීබල ජාතකය, විදුර ජාතකය, ගුත්තිල ජාතකය, තුන්ඩිල ජාතකය, සස ජාතකය හා ආසංඛවතී ජාතකය පෙන්වා දිය හැකි ය (පෙරේරා, 2006). තිවංක පිළිමගෙයි අන්තරාලයේ ඇඳ ඇති සිතුවම්වල දකුණුපස පහළ කොණට වන්නට කැලෑ රොදක් අසල වූ නෙළුම් විලක් වන අතර පිපුණු නෙළුම් ඇති එම විලෙහි දිය මත දරුවකු නිදයි. පසෙක එම දරුවා වඩා ගැනීමට දෝත දිගු කරන තවුසෙකි. එම විල අසල ම ගසක අත්තක ලැගුම්ගත් කුරුල්ලකු ද වෙයි. මොවුන්ට ඉහළින් මෙම ස්ත්‍රී-පුරුෂ සම්භෝග සිතුවම ඇඳ තිබේ (වික්‍රමසිංහ, 2010). පූර්වෝක්ත සම්භෝග සිතුවම නිර්මාණය වූ පොලොන්නරු යුගය වන විට ලක්දිවට චෝළ ආක්‍රමණ එල්ලවී තිබිණි. මෙම චෝළ ආක්‍රමණ හේතුවෙන් මෙරට බ්‍රාහ්මණ ඇදහිලි ප්‍රචලිත වූ අතර 1වන විජයබාහු රජු ද ඒවාට අතහිත දුන්නේ ය. මේ අනුව මෙම හින්දු ඇදහිලි හා විශ්වාස බෞද්ධ නිර්මාණ කෙරෙහි බලපෑවේ ය. පොලොන්නරුව තිවංක පිළිමගෙයට ද එකී ආභාසය ලැබී තිබූ අතර පල්ලව වාස්තුවිද්‍යා සම්ප්‍රදායට අනුව එය නිමවා තිබීම මෙයට නිදසුන් වේ. මෙම පිළිමගෙයිහි දක්නට ලැබෙන සම්භෝග සිතුවම ද ථෙරවාදී බෞද්ධ කලාවන්ට පටහැණි ව යන්නකි. 'එය ආසංඛවතී ජාතකයෙහි සිදුවීමක් නිරූපණය කරයි' යන්න බෙල් පැවසූ ව ද මාර්ටින් වික්‍රමසිංහ පවසන්නේ ආසංඛවතී ජාතකයෙහි එවැන්නක් නොමැති බව යි. කෙසේ වුව ද මෙහි දී බෙල් පවසන මතයට එකග විය හැකි අතර එහි සිටින්නේ ආසංඛවතී කුමරිය බව සිතිය හැකි ය. මෙම ස්ත්‍රිය හා පුරුෂයා සමීපයේ ම විශාල ගසක ලතාවක් ඉහළට එතෙන සිතුවමක් ද ඇඳ තිබීමෙන් පෙනී යන්නේ මෙම සංසිද්ධි දෙක ම ස්වභාවධර්මයේ පැවැත්මට බලපාන බව යි (මාපටුන, 2001). තිවංක පිළිමගෙයි මෙම සිතුවම හා අනෙකුත් සිතුවම් ඇඳීමේ දී එහි සිත්තරා ඉතා සියුම් සීමා රේඛා යොදා ගෙන තිබේ. එමගින් සිතුවම් ත්‍රිමාන අයුරින් නිරූපණය කිරීමට හැකි වී තිබේ. මේවා කළු, කොළ, රතු, කහ ආදී සීමිත වර්ණ කිහිපයකින් පමණක් සිතුවම් කර තිබේ. එකල චිත්‍ර ශිල්පියා භාවිත කර තිබූ අමුද්‍රව්‍ය හා තාක්ෂණය හේතුවෙන් බොහෝ කාලයක් අව්වැසිවලට මෙම සිතුවම් නිරාවරණය වී පැවතිය ද 20වන සියවස මුල් කාලයේ තිවංක පිළිමගෙයි සිදු කරනු ලැබූ ප්‍රතිසංස්කරණවල අතුරු පල ලෙස මෙම සම්භෝග සිතුවම ඇතුළු බොහෝ සිතුවම් ප්‍රමාණයක් විනාශයට පත් විය (චාර්ල්ස්, 2000).

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණයක් වන මෙම අධ්‍යයනය විශ්ලේෂණාත්මක ක්‍රමවේදය යටතේ සිදු කෙරිණි. මෙම ක්‍රමවේදයට අනුව ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය යන ප්‍රධාන මූලාශ්‍රය දෙකක් යටතේ තොරතුරු රැස් කෙරිණි. මෙහි ප්‍රාථමික මූලාශ්‍රය යටතේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වන පොලොන්නරුව තිවංක පිළිමගෙයි අන්තරාලයේ ඇඳි සිතුවම් මගින් තොරතුරු රැස් කෙරුණු අතර ඒ සඳහා එම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය නිරීක්ෂණයට ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදු කෙරිණි.

මෙහි ද්විතීයික මූලාශ්‍රය සඳහා පර්යේෂණ පත්‍රිකා, පර්යේෂණ ලිපි, පර්යේෂණ ග්‍රන්ථ, විචාර ග්‍රන්ථ, පුවත්පත්, සඟරා හා අන්තර්ජාල මූලාශ්‍රය යොදා ගැනිණි. එමෙන් ම පොලොන්නරුව තිවංක පිළිමගෙය භාර ව සිටින පුරාවිද්‍යා නිලධාරීන් සමග කෙරෙන සම්මුඛ සාකච්ඡා මගින් ද තොරතුරු රැස් කෙරිණි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

තිවංක පිළිමගෙය ඉදි කෙරුණු යුගය ලක්දිවට දැඩි ලෙස හින්දු බලපෑම එල්ලවී තිබූ අවධියක් විය. එනමුත් ලක්දිව සිතුවම් කලාවෙහි අනුරාධපුර යුගයේ සිට පැමිණි මහා සම්ප්‍රදාය පොලොන්නරු යුගය වන විටත් නො නැසී පැවතිණි. තිවංක පිළිමගෙයි බිතු සිතුවම් ප්‍රධාන වශයෙන් සිතුවම් කලා සම්ප්‍රදායයන් දෙකකට අයත් වෙයි. අන්තරාලයේ සහ ගර්භ ගෘහයේ ඇඳ ඇති සම්භාව්‍ය සිතුවම් පොලොන්නරුවේ මහ පැරකුම්බා රාජ්‍ය සමයටත් ප්‍රවේශ මණ්ඩපයේ සිතුවම් දඹදෙණි යුගයටත් හිමිකම් කියයි. ආසංඛවතී ජාතකය තිවංක පිළිමගෙයි අන්තරාලයේ ඇඳ ඇති ජාතක කථා අතුරින් තවත් එක් ජාතක කථාවකි. එච්. සී. පී. බෙල්ගේ වාර්තාවලට අනුව පූර්වෝක්ත සම්භෝග සිතුවම ආසංඛවතී ජාතකයෙහි එක් අවස්ථාවක් නිරූපණය කරනු ලබන්නකි (වික්‍රමසිංහ, 2010). මාර්ටින් වික්‍රමසිංහ පවසන්නේ ආසංඛවතී ජාතකයෙහි එවැනි සම්භෝග අවස්ථාවක් පිළිබඳ ව සඳහන් නො වන බවත් එහි සිතුවම් ශිල්පියා වාත්ස්‍යායනගේ කාම සූත්‍රයේ එන 'තීල-තණ්ඩුල' නම් සම්භෝග විධිය එහි ඇඳ ඇති බවත් ය. එමෙන් ම ඔහු තව දුරටත් පවසන්නේ සිතුවම ඇඳි කාලය හා සමකාලීන ව ලක්දිව විසූ ජනයා එය අසභ්‍ය චිත්‍රයකැ'යි නො සිතා එය දෙස බැලූ බව යි (වික්‍රමසිංහ, 2010). මෙම කරුණු අනුව හෙළිවන්නේ පොලොන්නරු යුගය වන විට ලක්දිව ආරාමික සම්ප්‍රදාය තුළ කලාකරුවාට ලබා දී තිබූ නිදහස යි. බුදු සිරිත හා බැඳුණු කලා කෘතිවලට පමණක් සීමා නො වී මිනිස් දිවිය හා බැඳුණු ලෞකික කලාවන් ද නිරූපණයෙහි ලා ඔවුන්ට සීමා නො පැනවුණු බව මෙම සම්භෝග සිතුවමින් පැහැදිලි විය.

තිවංක පිළිමගෙයි අන්තරාලයේ සිතුවම් කළ අවධිය හා සමකාලීන ව මෙරට තිබූ ආගමික පසුබිම ද ඒවාට බලපා තිබේ. එනම් පොලොන්නරු අවධිය වන විට මෙරට හින්දු ආගම දැඩි ලෙස ව්‍යාප්ත ව පැවතිණි (මාපටුන, 2001). ශිව ලිංගය සහ උමා යෝනිය පිදීම හින්දු දහමේ සිදු කෙරිණි. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සම්භෝගය ජීවයේ පැවැත්මෙහි ලා සිදු වන සුබ කටයුත්තක් බවට සැලකිණි. මෙම හින්දු ඇදහිල්ල එකල බුදු දහම සමග ද සම්මිශ්‍රණය වන්නට ඇත. බෞද්ධ ඇදහීම් හා හින්දු ඇදහීම් මිශ්‍ර වීමෙන් තැනුණු තවත් කලා කෘති තිවංක පිළිමගෙයි දක්නට ලැබෙන අතර එහි වාස්තු විද්‍යාව ද පල්ලව ගෘහනිර්මාණ ශිල්පයට වඩාත් නෑකම් කියයි. ඒ අනුව තිවංක පිළිමගෙයි අන්තරාලයේ සම්භෝග සිතුවම දෙස විශ්ලේෂණාත්මක ව බලන කල සනාථ වූ කරුණක් වූයේ එය නිර්මාණය කිරීමෙහි ලා සමකාලීන හින්දු ඇදහීම් ද බෞද්ධ කලාවන්ට බලපා ඇති බව යි.

**නිගමනය**

පොලොන්නරු යුගය වන විට මෙරට බෞද්ධ ආරාමික සම්ප්‍රදාය තුළ බෞද්ධ කලාකරුවාට කලා කෘති නිර්මාණය සඳහා විවෘත නිදහසක් ලබා දී තිබී ඇති බව මෙම පර්යේෂණය ඔස්සේ නිගමනය කළ හැකි ය. එමෙන් ම සමකාලීන ව ලක්දිව ව්‍යාප්ත ව තිබූ හින්දු ඇදහිලි හා විශ්වාස බෞද්ධ සිතුවම් කලාව තුළට ද ප්‍රවේශ වී තිබූ බැව් සනාථ විය.

**මුඛ්‍ය පද:** අන්තරාල සිතුවම්, ජාතක කථා, තිවංක පිළිමගේ, පොලොන්නරු යුගය

## ආශ්‍රිත ග්‍රන්ථ

චාර්ල්ස්, ඇ. ප., (2000). *පාරම්පරික සිංහල බිතුසිතුවම්*. පාදුක්කඃ මධ්‍යම සංස්කෘතික අරමුදල.

පෙරේරා, ල. (2006). *චිත්‍ර කලාව*. වරකාපොලඃ හෙළදිව ප්‍රකාශකයෝ.

මහින්ද, උ. (2013). *ලක්දිව බෞද්ධ චිත්‍ර කලා ඉතිහාසය*. කොළඹඃ සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

මාපටුන, න. (2001). *පොළොන්නරු යුගයේ සිතුවම්වලින් හෙළිවන සමාජය*. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, ම. (2010). *කළුනික සෙවීම*. රාජගිරියඃ සී/ස. සරස (පෞද්ගලික) සමාගම.

හේවාපතිරණ, ද (2012). *ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව*. කොළඹඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.